# පාඨශාලීය කෘෂිකර්ම අධ්‍යාපනය

ගම්පහ ඇම්. ඇස්. පෙරේරා මහතා විසිනි.

ලංකාවේ වර්තමාන අධ්‍යාපන ක්ෂෙත්‍රය තුළ දක්නට ලැබෙන්නේ පෙර නොවූ විරූ උද්යෝගයකි. එයට ප්‍රධාන හේතුව මුළු ලෝකයම මුහුණ පා ඇති ආර්ථික දුෂ්කර තාවයයි. ලෝක සංග්‍රාම දෙකක් නිසා ලෝක වාසීහු පසුගිය දශක දෙක තුන තුළ ආර්ථික දුෂ්කරතාවන්ගෙන් පෙළෙන්නට වූහ. ආර්ථික වශයෙන් පීඩාවට පත් නොවූ රටක් නැති තරම්ය. විශේෂයෙන්ම මේ දුෂ්කරතා වනට මුහුණ පෑවේ කෘෂිකාර්මික ජනසමාජ යක විසූවන්ය. ඒ නිසා වඩාත්ම මෙයින් පීඩාවට පත්වූවෝ ලංකාවාසීහුය.

සියවස් ගණනක සිට ලාංකිකයෝ කෘෂි කාර්මිකයෝය. එහෙත් යුරෝපියයන්ගේ ආක්‍රමණය නිසා කෘෂිකාර්මික සමාජය ධනෝපායන ජනසමාජයකට පරිවර්තනය විය. වෙළඳ වැවිලි ප්‍රධාන ධනෝපායන මාර්ග විය. මේ නිසා වූයේ අකර්මණ්‍ය ජනතාවක් බිහිවීමය. ලංකාව ස්වකීය පාලනයට ගත් විදේශීහු සිය ආධිපත්‍යය තහවුරු කර ගැනීම ටත්, ආර්ථික වශයෙන් තම මව් බිමේ පෝෂණයට අවශ්‍ය ධන නිෂ්පාදනය සඳහා වූ ව්‍යාපාර සංවර්ධනය කර ගැනීමටත් පසු බිම් වූ අධ්‍යාපන ක්‍රමයක් පිළියෙල කළහ.

අපි මෙහිදී විශෙෂයෙන්, පාඨශාලීය කෘෂි කර්මය සඳහා අධ්‍යාපන ක්ෂෙත්‍රයේ හිමිව ඇති තැනත්, ඉන් ලද හැකි ප්‍රයෝජනත් ගැන සළකා බලමු.

පුද්ගලයෙකු තුළ රට, ජාතිය, ආගම, ගැන ආදරයක් හැඟීමක් ඇති කළ හැක්කේ පවිත්‍ර මනසක් ඇති පාසැල් අවධියේ සිටය. ආගම් කර්තෘවරු, අධ්‍යාපන විශේෂඥයෝ මනෝ විද්‍යාඥයෝ මේ මතය ඉදිරිපත් කළා පමණක් නොව ඒවායේ සාර්ථක අසාර්ථක තාවය ගැන විමර්ෂණය කර තෘප්තියටද පත්වූහ. කෘෂිකර්මය රටේ පවත්නා ආර්ථික දුෂ්කරතා මඟ හරවා ගැනීම සඳහා ගනු ලබන ප්‍රධාන ක්‍රියා මාර්ගයකි. අධ්‍යාපන ක්ෂෙත්‍රය තුළ කෘෂිකර්මය කෙරෙහි මෙතරම් උනන්දුවක් දක්නට ලැබෙන්නේ එහෙයිනි. රටේ උපදවන ධනයෙන් වැඩි කොටසක් වැය කරනුයේද කර්ෂිකර්මාන්තය හා අධ්‍යාපනය සඳහාය. 1967-1968 අය වැය ලේඛණයෙන්ද ඒ සඳහා විශේෂ සැලකිල් ලක් දක්වා තිබීම ඉතා වැදගත්ය. ප්‍රාග්ධන ආයෝජනයෙන් වැඩි කොටස කෘෂිකර්මාන් තය සඳහා යොදවන බව මුදල් ඇමතිතුමා ගේ මෙවර අය-වැය කථාවෙන්ද පැහැදිලි විය. ඒ අනුව 1967-1968 අය වැයෙන් රුපියල් කෝටි විසිහතරක් කෘෂිකර්මය සඳහා වෙන්කර ඇත. මේ වෙන් කිරීමේ පරමාර්ථය 1970 වන විට ලංකාව ආහාර අතින් ස්වයංපෝෂිත කිරීමයි. මෙම පරමාර් ථය මුදුන් පත් කරගැනීමේ භාරධූර කාර්ය යෙන් වැදගත් කොටසක් පැවරී ඇත්තේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන දෙපාර්තමේන්තුව කෙරෙහිය.

රටේ ජාතියේ ප්‍රගතිය උදෙසා පාඨශාලා ශිෂ්‍ය ශිෂ්‍යාවන් කෘෂිකර්මය වෙත යොමු කිරීම වැදගත්ය. පාඨශාලා විෂය මාලාවට කෘෂිකර්මය ඇතුලත් කර ශිෂ්‍ය ශිෂ්‍යාවනට ප්‍රායෝගික වශයෙන් මෙන්ම—විද්‍යාත්මක වශයෙන්ද අවබෝධයක් ලබා දී ඒ මගින් කෘෂිකර්මාන්තයෙහි උනන්දුවක් ඇති කිරීම ඉතා වැදගත් කාර්යයකි. වාරිකව පැවැත් වෙන ශ්‍රමදාන ව්‍යාපාර මගින් සිසු උනන්දුව දියුණු වෙයි. මේ හැර වල් නෙළීම්, පැළ සිටුවීම් වැනි සමාජයීය කටයුතු වලදී ශිෂ්‍යයින්ගේ ආධාර ලබාගැනීමට අවස්ථා අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් සකස් කර තිබීම පොදු ජනතාවගේ යහපතට හේතුවේ.

අවශ්‍ය බීජ, උපකරණ හා උපදේශකවරුන් ලබාදීම ඉතා අවශ්‍යව ඇති මේ අවධියේ පාඨශාලීය කෘෂිකර්මාන්ත සංවර්ධනයෙහි ලා ගුරුවරුන් සඳහා සමසක කෘෂිකාර්මික පුහුණුවක් දීමට කටයුතු කරගෙන යාම වැදගත් පියවරකි. ක්‍රමානුකූල කෘෂිකර්මය පිළිබඳ අවබෝධයක් ලබාදීම සඳහාත්, සාමාන්‍ය ජනතාව කෘෂිකර්මාන්ත සංවර්ධන කටයුතු සඳහා උනන්දු කිරීමටත් පාඨශාලීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් උනන්දු කිරීමටත්, දරණ උත්සාහය සාර්ථක කර ගැනීම සඳහා ගුරුවරුන්ගේ සහයෝගය අත්‍යාවශ්‍යය. පුද්ගලයෙකු හොඳ හෝ නරක මාර්ගයකට යොමු කරවීමේ අපිරිමිත බලයක් ගුරුවරයා සතුව ඇත. බාල දරුවාගේ හැඩ ගැසීම ඇති වනුයේ ගුරුවරයා තුළ පවත්නා පෞරුෂය, ආකල්ප හා කෞශල්‍යතා වල බල පෑම හේතුකොටගෙනය. එබැවින් කුඩා අවධියේ සිට කෘෂිකර්මාන්තය පිළිබඳව විද්‍යාත්මක හා ප්‍රායෝගික දැනුමක් හා පුරුද්දක් ශිෂ්‍යයන්ට ලබාදීමේ කාර්යය රැඳී ඇත්තේ ගුරුවරයා අතෙහිය. එක් පාසලකට එක් කෘෂිකර්ම ගුරුවරයෙකු බැගින් වත් සිටියහොත් අපේ බලාපොරොත්තු මුදුන් පත්කර ගැනීමට අපහසුවක් නැත.

කෘෂිකර්මාන්තය පිළිබඳව වර්තමානයේ පවත්නා උද්යෝගය සර්වප්‍රකාරයෙන්ම සාර්ථක කර ගැනීමෙහි ලා මුලින් සඳහන් කළ කරුණු කෙරෙහි සැලකිල්ල දක්වීම හැම පුරවැසියකුගෙන්ම ඉටු විය යුතුයි. මේ සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අන්‍යොන්‍ය සහයෝගය තිබිය යුතුය. එවිට අද පවත්නා ආර්ථික හා ආහාර අගේතිය ඉක්මනින්ම මඟ හරවා ගැනීමට බොහෝ දුරට හැකිවේ.

නිමි.



"අඩෝ කොලුං පිංනාමියේ! මේ අපාගතවෙන වැඩ කරන්නේ? අද පෝයදා බය ප්‍රාණඝාත අකුසල් කරල කොහේ යන්නද කොලු?"
"හෙට පෙරහැර බලන්නයන්න ඕයේ"
ධම්සිරි.